

ග්‍රේන් කන්දේ
අභිරහස
තරුෂි චමෝද්‍යා කුමාරසිංහ

# ග්‍රේන් කන්දේ අභිරහස

තරුෂි චමෝද්‍යා කුමාරසිංහ

**ISBN - 978-624-206-620-2**

චිත්‍ර - තරුෂි චමෝද්‍යා කුමාරසිංහ

එළි දැක්වීම - **2023 – 11 -15**

# පිදුම

මා වෙනුවෙන්

අපමණ වෙහෙසෙන

අම්මාටත් , තාත්තාටත් ,

සීයාටත්

පුදමි සෙනෙහසින්

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයන් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පැසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී.දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යශය අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023 – 11 – 01**

# පටුන

| පටුන | පිටු අංකය |
|---|---|
| **01.**අද්භූත මාලිගාව | 01 |
| **02.**කොරිඩෝවේ අතරමං වී | 03 |
| **03.**සිහිනය | 06 |
| **04.**අද්භූත කටහඬ | 08 |
| **05.**ලේ සලකුණු ඔස්සේ | 10 |
| **06.**බිත්තියේ තිබූ පණිවිඩය | 12 |
| **07.**අවතාරය | 14 |
| **08.**පැනයාම | 16 |

# අද්භූත මාලිගාව

ග්‍රීෂ්ම නිවාඩුව හේතුවෙන් ඇන්ජී තම යහලුවන් දෙදෙනා වන පීටර් සහ ඩැනියල් සමඟ සෙල්ලම් කිරීමට යෑම සඳහා වේගයෙන් දිව ගියා ය.

‘‘සුභ උදෑසනක් ඔලිවර් මහත්තයා, ඔයාටත් සුභ උදෑසනක් සැමුවෙල් නෝනා’’ තමා ට මඟ දිගට හමු වන දන්නා නොදන්නා සියලු දෙනාට ම සුභ පතමින් ඇන්ජී දිව ගොසින් තම යහලුවන් අසල නැවතුනි.

‘‘හලෝ.....පී..ටර් , හලෝ.....ඩැනි...යල් ඇන්ජී හති අරිමින් කිවා ය.

‘‘ හලෝ ඇන්ජී, අපි අද මොනවද කරන්නේ ? ’’ පීටර් ඇසුවේ ය.

‘‘ මම හිතුවේ අපි අද ඇවිදින්න යනවා කියලනේ,’’ ඩැනියල් ප්‍රශ්නාර්ථ බැල්මක් හෙලුවේ ය.

‘‘ ඔව් , අපි අද ග්‍රේන් කන්දට යමු.’’ ඇන්ජී සතුටින් කීවාය. ‘‘ අපි කන්ද මුදුනට ගිහිල්ලා සෙල්ලම් කරමු.’’

ඔවුහු ග්‍රේන් කඳු මුදුන කරා ඇදුණෝ ය. වයලට් මල් යායකින් සමන්විත කඳු පාමුලට පැමිණි ඔවුන්ට දකින්නට තිබුණේ කුරුල්ලන් ගී ගයමින් පියාඹන අයුරු ය.

‘‘ අනේ මට හරි මහන්සියි, අපි ටිකක් නැවතිලා යමු.’’ ඇන්ජී ගලක් පාමුල හිඳ ගනිමින් කීවාය.

මෙදින ග්‍රීෂ්ම ඍතුවේ එක් දිනක් බැවින් රස්නිය උපරිමයෙන් පැවතුණි.

‘‘ ඇන්ජී අර බලන්න.’’ එක් වරම ඩැනියල් යමක් පෙන්නුවේ ය.

ඒ දෙස බැලූ ඔවුන්ට දැකගත හැකි වූයේ ඔවුන් සිටින දෙසට දුව එන ගැහැනු ළමයෙකි.

ඇගේ වරලස කෙටි ය. රන්වන් පැහැති කෙස් ඇගේ නෙත් සඟලට මනා ලෙස ගැළපුණි.

‘‘ කේට්’’ ඇන්ජීගේ මුහුණ අඳුරු විය. ‘‘ එයත් මේ වෙලාවෙම ආවානේ.’’

කේට් යනු ඇන්ජීගේ , පීටර්ගේ සහ ඩැනියල්ගේ පන්තියේ ඉගෙනුම ලබන ගැහැනු ළමයෙකි. සැමවිටම ඇන්ජීට කරදර පමුණුවන ඇය එයින් මහත් සතුටට පත් වූවා ය.

‘‘ කොහොමද මෝඩ පැටවුනේ.’’ කේට් අවඥා සහගත බැල්මක් හෙළුවා ය. ‘‘ කොහෙද මේ යන්නේ.’’

‘‘ ඔයාට ඒකෙන් වැඩක් නෑනේ කේට්.’’ ඇන්ජී කෝපය පිරි හඬකින් කීවා ය.

‘‘ හරි , හරි මම ආවේ ඔයාලා මොනවද කරන්නේ කියලා බලන්න.’’ කේට් කීවාය. ‘‘ කොහොමත් මට ඔයාලගේ පිස්සු වැඩ වලට එකතු වෙන්න ඕනි නෑ. අනික මම ඔයාට................’’

කේට් හදිස්සියේ ම කියන්නට ගිය දේ නතර කළා ය.

“ ආ ඔය ඔයාගේ බෙල්ලේ එල්ලන් ඉන්නේ කැමරා එකක් නේද?” ඇය ඇන්ජීගේ ප්‍රියතම කැමරාව දෙස බැලුවා ය.

එක් වරම කේට් කමරාව උදුරාගෙන කඳු මුදුන දෙසට දිවුවා ය.

“ ඒයි කේට් ඔහොම නවතින්න මගේ කැමරාව දීලා යන්න.” ඇන්ජී කෑ ගසමින් කේට් පසුපස දිවුවා ය.

පිරිමි ළමයි දෙදෙනා ද ඔවුන් දෙදෙනා පසුපස දිවුවෝ ය.

“ හූ , හූ මාව අල්ලන්න බෑනේ.” කේට් කෑ ගසාගෙන දිවුවා ය.

එහෙත් නොසිතූ මොහොතක ඇගේ පය ගලක හැපුණි මුනින් අතට තණගොල්ල මතට වැටුණු කේට් ගේ අතින් කැමරාව ගිලිහුණි.

ඇන්ජී එකවර ම කේට් ගේ ඇඟට පැන රණ්ඩු කරන්නට වූවාය.

පීටර් දිව ගොස් වැටුණු කැමරාව ඇහිද ගත්තේ ය,

“ ඇන්ජී , අනේ රණ්ඩු කරන එක නවත්තන්න.” ඩැනියල් කෑ ගැසුවේ ය. “කේට් ඇන්ජී ඕක නවත්තන්නකෝ.”

එක වරම පීටර් ඔවුන්ට කතා කළේය.

“ අර බලන්න , ඔයාලා ඒක දැක්කද ?”

ඇන්ජී කේට් සමඟ කළ පොරබැඳීම නවතා නැගී සිට පුදුමයෙන් බැලුවා ය.

පුදුමයකි ! ග්‍රේන කඳු මුදුනේ මෙතෙක් කල් නොදුටු අරුම පුදුම අද්භූත මාලිගාවකි.

# කොරිඩෝවේ අතරමං වී

" ඒක කලින් එතන තිබුණේ නැනේ." ඩැනියල් කීවේ ය.

එය විශාල මාලිගයකි. කුලුනු සතරක් දිශා සතරට පිහිටි මෙහි පෙනුම පැරණි රජ මාලිගයක් වැනිය.

" දැන් ඔයාලා කියන්නේ මේක මෙතනට ඉබේම කඩා පාත් උනා කියල ද?"

කේට් අවඥාවෙන් සිනාසුණා ය. " මරු වැඩේ."

ඇන්ජි ඈ දෙස රවා බැලුවා ය. " මොනවා උනත් කමක් නෑ , දැන් ටිකකට කලින් මේක තිබුණේ නැනේ."

" මම කියන්න ද අපි ඒක ඇතුළට ගිහිල්ලම බලමුද?" පීටර් ඇසී ය.

" ඕ,,, මමත් කැමතියි ගිහිල්ලා බලන්න." ඩැනියල් එයට එකඟ වුණේ ය.

" හරි, එහෙනම් අපි තුන්දෙනා ගිහිල්ලා බලමු." ඇන්ජි සතුටින් කීවා ය.

කේට් එක්වරම එයට හරස්වුණි.

"මොකක්ද කිවුවේ තුන්දෙනා? , ඇන්ජි මෙතන හතර දෙනෙක් ඉන්නවා"

" නෑ" , ඇන්ජි සිනහවක් මුව රඳවාගෙන කීවාය. "මමයි , පීටරුයි , ඩැනියලුයි , මම්... තුන්දෙනයි ඉන්නේ"

" එතකොට මම" කේට්

කෑ ගැසුවා ය. " මමත් එනවා , ඔව් මම එනවමයි." කේට් එකවරම මාලිගය දෙසට දිවුවා ය.

අනිත් තිදෙනා ද ඈ පසුපස ගියෝ ය.

" මේ කේට් නම් මාර වදයක්." ඇන්ජි පැවසුවා ය.

ඔවුහු සිව්දෙනා මාලිගයේ විශාල ඕක් දොරටුව අභියසට පැමිණියෝ ය.

පුදුමයට කරුණක් වූයේ එම ඕක් දොරටුව ඉබේම ඇරී තිබීමයි.

" මේක කොයි වෙලාවේද  ඇරුණේ ?" " දැන් අපි දුවගෙන එනකොටත් මේක වහලනේ තිබුණේ"

" ඒකෙන් වැඩක් නෑ." ඇන්ජී කීවා ය.  " අපි ඇතුළට ගිහිල්ලම බලමු."

ඔවුහු ප්‍රධාන දොරටුවෙන් මාලිගය ඇතුළට පිවිසුණෝ ය.එහි ඇතුළත විස්මය ජනකය.දෙකට බෙදුණු තරප්පු පෙළක් සහිත ශාලාව ඉටි පන්දම් වලින් ආලෝකමත් වී තිබුණි. මාලිහයේ බිත්ති මත පැරණි සිතුවම් රාශියක් එල්ලා තිබුණේ ය.

" කවුරු හරි ඉන්නවද?" ඇන්ජි කෑ ගැසුවා ය. " හේයි . ඇහෙනවද ?"

කේට් සිනාසුණාය.'' අනේ , අනේ.........මෝඩ බබෝ'' ඇය කීවාය.

'' ඔහොම කෑ ගැහුවා කියලා කවුරුත් එන්නේ නෑ.''

'' අනේ මේ කේට් ටිකක් කටවහගෙන ඉන්න බැරිද.'' ඇන්ජී කීවාය. '' අනික මට හරි අමුත්තක් දැනෙනවා.''

'' ඔව් , මටත්'' ඩැනියල් කීවේ ය. '' මට දැනෙන්නේ අපි එන්න ටික වෙලාවකට කලිනුත් මෙතන කවුරුහරි හිටියා කියලා.''

කේට් නැවත වරක් සිනාසුණා ය.''අනේ.....දැන් ඔයා කියන්නේ අපි ආපු ගමන් ම මේ ගෙදර අය අන්තරස්දාන උනා කියල ද?''

කේට් සිනහව නවතන විට දුටුවේ අනෙක් තිදෙනා වට වී යමක් දෙස උවමනාවෙන් බලා සිටින ආකාරයයි. කේට් ද දිව ගොස් ඒ දෙස බැලුවා ය.

එය රන් ආලේපිත රාමුවක් සහිත චිත්‍රයකි.

චිත්‍රයේ සිටියේ තරුණ ගැහැනු ළමයෙකි.කලුවන් දිගු ගවුමකින් සැරසී සිටී ඇගේ කෙස් කළඹ ඉතා දිගු ය. ඇගේ නෙත් කොළ පැහැති ය.

'' කවුද මේ'' ඇන්ජී ඇසුවා ය.

'' මම හිතන්නේ ඒ මේ මාළිගාවේ කුමාරිකාව වෙන්න ඇති'' ඩැනියල් කිවේ ය.

'' ඔව් , ඒ වගේ'' කේට් තරහින් කීවා ය. '' හැබැයි මම තරම් ලස්සන නෑ.''

ඇන්ජී සිනාසුණා ය.''ඔව් ඔව් ජේනවා.''

'' අනේ ඔය දෙන්නගේ රණ්ඩු නවත්තන්නකෝ පීටර් කෙදිරි ගෑවේ ය.

'' දන් අපි මොනවද කරන්නේ?''

අපි හතර දෙනා බෙදිලා ගියොත් හොද නැද්ද'' ඇන්ජී යෝජනා කළා ය.

පීටර්ගේ මුවගේ සිනහවක් රැදුණි. '' නියම වැඩේ , මමයි ඩැනියලුයි පඩිපෙළේ දකුණු පැත්තට යන්නම්.''

'' ආ හොඳයි'' ඇන්ජී කීවාය. එහෙත් එකවරම

''මොකක්ද ? එතකොට මම?'' ඇන්ජී ඇස්කොනින් කේට් දෙස බැලුවා ය.

''එහෙනම් සුභ පැතුම්!'' යැයි කෑගැසු පීටර් සහ ඩැනියල් දකුණු පසට දිවුවෝ ය.

'' ආ හොඳයි'' ඇන්ජී සුසුමක් හෙළුවා ය. '' එහෙනම් කේට් අපි දෙන්නා යමු.''

'' ඔයා ඒක මට කියන්න ඕනි නෑ'' කේට් කීවා ය. ''මම දන්නවා.''

ඇන්ජී හා කේට් වම් පසට ගමන් කළහ.එහි නිමක් නොමැති කොරිඩෝවක් විය. කෙතරම් දුර ගමන් කළත් එහි නිමක් නොවීය.යන අතරමඟ ඔවුන් දෙදෙනා එකිනෙකා සමඟ කතා නොකළහ. එහෙත් ඔවුන් කොරිඩෝවේ අවසානයට පැමිණියහ. එය හිස් ය. එම කොරිඩෝවේ යෑම නිශ්ඵල විය.

“ හොඳයි , අපි මෙච්චර දුරක් ආවේ අපරාදේ කේට් කීවා ය.

“ඔව් අපරාදේ” ඇන්ජී කීවා ය.

“ එහෙනම් ඉතින් අපි දෙන්නා ආපහු හැරිලා යමු.”

“ ඇන්ජී “ කේට් එක වරම කෑ ගැසුවා ය.

“ අර අතන මොනවද වැටිලා තියෙන්නේ.”

ඈ බිම තිබූ යමක් පෙන්නුවා ය.

ඇන්ජී ඒ දෙස බැලුවා ය. පෙනුමෙන් රතු පැහැති ඝන දියරයක් වූ එය පරීක්ෂා කිරීමට බිම දණගැසූ ඇන්ජීගේ මුවින් හඬක් පිටවුණි.ඇය කේට් දෙස බිය මුසු බැල්මක් හෙළුවාය. ඇගේ මුවින් පිට වූයේ එක් වචනයකි.

“ලේ”

# සිහිනය

මේ වන විට පීටර් සහ ඩැනියල් ද අනෙක් කොරිඩෝවේ කෙළවරට ම පැමිණ තිබුණි. එම කොරිඩෝව ද පෙර මෙන්ම අවසානයක් නොතිබුණි.

''නියමයි, අපි මෙච්චරක් දුර ආවේ මේ වගේ කොරිඩෝවක ද'' පීටර් කීවේ ය.

'' දැන් ඉතින් හැරිලා යමු.'' ඩැනියල් කිවේ ය.

'' අර දෙන්නවත් හොයා ගන්න එපැයි.''

එහෙත් නොසිතූ විරූ මොහොතක සිදු වූයේ භයානක දෙයකි. කොරිඩෝව ආලෝකමත් වී තිබූ ඉටි පන්දම් සියල්ලම ඉබේම නිවුණි. කොරිඩෝව ම අන්ධකාරයෙන් ගිලුණි.

'' පීටර්'' ඩැනියල් මිමිණුවේ ය. '' කොහොමද මේ ඉටි පන්දම නිවුණේ.''

''ඒක තමා දැන් පොඩි හුළඟක්වත් ආවේ නෑ.'' පීටර් කිවේ ය.

'' පොඩ්ඩක් ඉන්න මන් ගාව ටෝච් එකක් තියනවා.'' කී ඩැනියල් තම සාක්කුවට අත දමා කුඩා විදුලි පන්දමක් අතට ගත්තේ ය. එය දල්වූ ඔවුහු හිමින් හිමින් කොරිඩෝවෙන් පිටවීම පිණිස ඉදිරියට ගමන් කළෝ ය.

* * * * * * * * *

ඔවුන්ට විරුද්ධපස ඇති කොරිඩෝවේ ඇන්ජි කේට්ගේ අතින් ඇදගෙන දුවමින් සිටියා ය.

''අනේ ඇන්ජි අපි ටිකක් නැවතිලා යමුකෝ.''

'' බෑ බෑ කේට්.'' ඇන්ජි දුවමින් පැවසුවා ය. ''අපිට නතර වෙවී ඉන්න බෑ.''

''අනේ මට හරි මහන්සියි'' කේට් කෙඳිරි ගෑවා ය.

''හරි එහෙනම් අපි ටික වේලාවක් නැවතිලා ඉදලා යමු.'' ඇන්ජි කීවා ය.

ඔවුහු දෙදෙනා දිවීම නවතා බිම හිඳ ගත්හ. ටික වේලාවක් යන විට නොදනුවත්වම ඇන්ජි හට නින්ද ගියා ය. අය සිහිනයක් කරා පාවී ගියා ය.

ඇය සිටියේ මාලිගයේ බිම් මහලේය.සුළු මොහොතකට පෙර ඔවුන් උවමනාවෙන් බැලූ රාමු කරන ලද පින්තූරය එලෙස ම තිබුණි. එහෙත් එය ඉදිරියේ දෙපළක් ඉටි පහන් දල්වමින් සිටියෝ ය. ඔවුන් දෙදෙනා පෙනුමෙන් රජ කෙනෙකු හා රැජිනක් ලෙස පෙනුණි. රජතුමා හඬමින් සිටි අතර.රැජින ඔහුව සනසමින් සිටියාය.

'' මගේ දූ කුමරිය මාව දාලා ස්වර්ගයට ගියා.''රජු කීවේ ය.''ඒත් ඒක වුණේ කොහොමද ?''

'' රජතුමනි , සන්සුන් වෙන්න.'' රැජින කීවාය.

'' ඒත්'' රජු කීවේ '' මට හිතාගන්න බෑ, මම බලනකොට එයා උඩතට්ටුවෙන් වැටිලා හිටියේ.''

“ එයා නිකම්ම වැටෙන්න ඇති” රැජින කීවාය. “ දැන් ඉතින් අපි හිත හදාගමු.”

ඇන්ජීට මේ කිසිවක් වැටහුණේ නැත. තමා ඉදිරිපස සිටින දෙදෙනාගේ කතා බහ ද ඇයට තේරුණේ නැත.ඊළඟ මිනිත්තුවේද දී ඇය සිටියේ මාලිගයේ උද්‍යානයේ ය. ඇය වටපිට බැලුවා ය. ඇයට ඉදිරියෙන් කවුරුන්හෝ බිමවැටී සිටියේය. ඇය වැටී සිටි පුද්ගලයා ළඟට ගොස් බැලුවා ය.

ඒ කළුවන් හිසකෙස් සහිත කොළ පැහැති නෙත් ඇති තරුණියක් බව ඇයට වැටහුණි. එම තරුණියගේ මුහුණ තුවාල වී ලේ ගලමින් තිබුණි. ඇන්ජී බිය වී පසෙකට පැන්නාය. මාලිගයේ ඇති රාමු කරන ලද පින්තූරයේ සිටිනා ලස්සන ගැහැනු ළමයාම බව ඇන්ජීට වැටහුණි. අන්ජී සිරුර දෙස බැලුවා ය. ඇය මිය ගොස් ඇත. ඇය ජීවතුන් අතර නැත. ඇන්ජී මළ සිරුර දෙස ඇසිපිය නොහෙලා බලා සිටියාය. ඇයට සියල්ලම වැටහුණි.

එක්වරම ඇන්ජීට දැනුණේ කවුරුත් හෝ ඇයට නම කියා කතා කරන වගයි. ඇය එම කටහඬ සාවධානව අසා සිටියාය.

“ ඇන්ජී , ඇන්ජී නැගිටින්න.” ඒ පීටර් ය. පීටර් සහ ඩැනියල් ඔවුන් ව සොයාගෙන ඇත.

# අද්භූත කටහඬ

ඇන්ජී ගැස්සී ඇහැරුණාය. පීටර් ඩැනියල් සහ කේට් ඇ දෙස බලාසිටියෝ ය.

“ ඇන්ජී ඔයා හොඳින් නේද” පීටර් ඇසීය.

“ ඔව්” ඇන්ජී කීවාය. “ඔය දෙන්නා කොහොමද අපිව හොයාගත්තේ.”

පීටර් සියල්ල විස්තර කළේය. “ ඊට පස්සේ අපි දෙන්නා හිමින් හිමින් එද්දී දැක්කා එළියක් අපි දෙන්නා දැනගත්තා අනින් කොරිඩෝවේ ඉටි පන්දම් නිවිලා නෑ කියලා”

ඇන්ජී සිටගත්තා ය. “ දැන් ඉතින් අපි මෙහෙන් පිට වෙන්න බලමු.”

අනිත් තිදෙනා මාලිගයෙන් පිට වන මාර්ගය ගැන කල්පනා කරමින් සිටියහ.

එහෙත් ඇන්ජීගේ සිහිය තිබුණේ ඇය දුටු සිහිනය ගැනයි. ඇය ඒ ගැන සිත සිතා සිටියදී එක්වරම ඇයට කටහඬක් ඇසුණි. එය ඇගේ කණට කොඳුරන්නාක් වැනි හඬකි.ඇන්ජී එම කටහඬ හොඳින් අසා සිටියා ය.

“ ඇන්ජී , ඇන්ජී” කටහඬ දිගින් දිගටම ඇන්ජීගේ නම කෙදිරුවේය. කටහඬ කෙමෙන් කෙමෙන් තියුණු විය. ඇන්ජීට එය ඉවසිය නොහැකි වාවා ය. ඇය තම අත් වලින් කන්දෙක වසා ගත්තා ය. “එපා , එපා” ඇය කෙදිරුවා ය.

අනිත් තිදෙනා ඇන්ජී දෙස බැලුවෝය. “ඇන්ජී ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් ද?” පීටර් ඇසීය. එහෙත් ඇන්ජීට පීටර්ගේ ප්‍රශ්නය ඇසුණේ නැත. ඇන්ජීට ඇසුණේ කොඳුරන කටහඬ පමණයි.එම කටහඬ වචන මාරු කළාය.

දැන් එම කටහඬ පවසන්නේ වෙනත් දෙයකි.” ඔබට මෙහෙන් යෑමට අවශ්‍යනම් මා පසුපස එන්න , එන්න.”

ඇන්ජී පියවි සිහියට පත් වූවා ය. “ මට කටහඬක් ඇහුණා.” ඇය කීවාය. “ඔයාලටත් ඒක ඇහුණා නේද?”

“ මොකක්ද කටහඬක්” අනින් තිදෙනාගේ මුහුණේ ප්‍රශ්නාර්ථ බැල්මක් තිබුණි.

“ඔව්,කටහඬක්” ඇන්ජී කීවා ය. “ඒක මට කතා කළා.”

පීටර් ඇන්ජී දෙස බැලුවේ ය. “ඇන්ජී ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් නේද?, අපිට කියන්න.”

ඇන්ජී සියල්ල විස්තර කළා ය. ඇය දුටු සිහිනය හා කටහඬ කියූ දේ පිළිබඳවත්

“පොඩ්ඩක් ඉන්න ඇන්ජී” කේටී කීවාය.

“මේ හැම දෙයක් ම එකකට එකක් ගැළපෙනවා”

“ඔව් “ ඩැනියල් කීවේ ය.” ඒ ගැනු ළමයා මැරිලා, ඒ කියන්නේ...” ඔහු අනිත් තිදෙනා දෙස බැලුවේ ය.

“ ඒ කියන්නෙ එයාගේ අවතාරය අපි පිටිපස්සෙන් එනවා” ඇන්ජී එය සම්පූර්ණ කළා ය.

ඩැනියල් ඔළුව වැනුවේ ය. කේට් බිය වී වටපිට බැලුවාය.

“ ඔව්” පීටර් කීවේය. “මේ දැනුත් එයා අපි දිහා බලාගෙන ඇති” ඔහු කීවේ ය.

ඇන්ජී තොල සපාගත්තා ය. එක් වරම ආයෙත් අර අද්භූත කටහඬ ඇයට ඇසුණි. එවර ඇසුණේ කියමනක් නොව ගීතයකි.

“ඔන්න ආයේ මට ඒක ඇහෙනවා” ඇය අනෙක් තිදෙනා දෙස බලමින් කීවාය. එහෙත් එවර එම කටහඬ ඇයට පමණක් නොව අනිත් අයට ද ඇසෙන බව ඇයට වැටහුණි. ඔව්හු එය සාවධානව අසා සිටියහ.

“ඔබ සැමට මගේ ජීවිත කතන්දරය කියනට අවසර දෙනු මැන”

“මගේ මරණය කෙතරම් බිය ජනකද යැයි සිතනු මැන.”

ඔවුන්ට එක්වරම දැනුනේ කොරිඩෝව මතට ජල බිංදු වැටෙන බවයි. ඒ දෙස බැලූ ඔවුන් වටහා ගන්නේ ඒ ජලය නොව ලේ බවයි.

ඔවුහු භීතියට පත් වී එකිනෙකා දෙස බැලූ හ.

# ලේ සලකුණු ඔස්සේ.

කොරිඩෝවේ තැනින් තැන ලේ සලකුණු විය. එම ලේ සලකුණු මෙතෙක් වෙලා නොතිබුණු බැව් ඔවුනට විශ්වාසය.

“ අපි දැන් මොනවද කරන්නේ?” භීතියට පත් වූ කේට් ඇසුවාය.

“ අපි ලේ සලකුණු පස්සේ යමු.”

ඇන්ජි ස්ථිරවම කියා සිටියාය.

අනිත් තිදෙනා තුෂ්නිම්භූත වී ඇන්ජී දෙස බලා සිටිය හ.

“ඔයා විහිළු කරනව ද?” කේට් සැක සහිතව ඇසුවා ය.

“ නෑ” ඇන්ජි සිනාසෙමින් පැවසුවා ය. “ මම කැමති ලේ පස්සෙන් ගිහිල්ලා අර අවතාරෙත් එක්ක තේ ටිකක් බොන්න.” කියූ ඇන්ජි සිනාසෙමින් ඉදිරියට ගමන් කළාය.

අනිත් තිදෙනා විස්මයෙන් ඇය යන දෙස බලා සිටියා ය. එයාට හොල්මනක් වැහිලා ද?” කේට් ඇසුවා ය.

පීටර් උරහිස් හැකිලුවේ ය.

“ මම හිතන්නේ එයාගේ මොළේ හොඳ නැති වෙලා”ඩැනියල් කීවේ ය.”පව් ඇන්ජි” එසේ කියූ ඔවුන් තිදෙනා ඇන්ජි පසුපස ගමන් කළ හ.

ඔවුන් ගමන් කළේ නිහඬවම ය. ඔවුහු කතා කිරීමට බිය වූවෝ ය. ඒ අවතාරය ඔවුන් දෙස බලා සිටිනවා යැයි හැඟුණු නිසාවෙනි.

ඔවුන්ගේ ගමන නැවතුනේ දොරටුවක් අසලිනි. ඇන්ජි දොරටුව ඉදිරිපස නැවතුණා ය.

“ හරි එහෙනම් මේ දොර ඇරලා ඇතුළට යමු.”

“හැබයි ඊට කලින් ඔයාලා මට දෙයක් පොරොන්දු වෙන්න ඕන.” ඇන්ජි බැරෑරුම් ලෙස කීවා ය.

“මොකක්ද?” පීටර් පුදුමයෙන් ඇසුවේ ය.

ඇන්ජි සුසුමක් හෙලුවා ය. “ මෙතනදී මට මොනවාහරි උනොත් ඔයාලා තුන්දෙනා මෙහෙන් යන්න ඕනි”

“මොනවද ඔයා මේ කියන්නෙ අපි ඔයාව දාලා යන්නේ නෑ” ඩැනියල් කීවේ ය.

“ ඔව් ඇන්ජි , අපි ඔයත් එක්කම ඉන්නවා” කේට් කීවාය. “ අනික ඔයාට මුකුත් ම වෙන්නෙ නෑ” එසේ කියූ කේට් ඇන්ජීව වැළඳගත්තා ය.” මට සමාවෙන්න ඇන්ජි, ඔයා තමා දැන් මගේ හොඳම යාළුවා” ඇය කීවාය.

“ස්තූතියි කේට්” ඇන්ජී කීවා ය.

ඉන් පසු ඔවුහු සිව්දෙනා දොර හැරියහ. එයින් කිරි..කිරි හඬක් නැගුණි. පුදුමයට කරුණක් වූයේ දොරෙන් එහා විශාල පඩිපෙළක් තිබීමයි. පඩිපෙළ රතු පළසකින් අලංකාර කර ඇත. පඩිපෙළ දෙපස ඉටිපන්දම් ආධාරයෙන් ආලෝකමත් වී ඇත.

“මෙතනින් කොහාටද දන් නෑ යන්නේ?” ඩැනියල් ඇසුවේ ය.

“ අනේ මන්දා , කමක් නෑ අපි යමු.”

ඔවුහු සිව් දෙනා සෙමින් සෙමින් පඩිපෙළ නැඟ ගියහ.එහි අවසානය වූයේ අලංකාර නිදන කාමරයකි.

ඔවුහු නිදන කාමරයට ඇතුළු වූහ. එය ඉතාමත් ම විස්මය ජනක කාමරයකි.එහි තිබූ නිදන ඇඳ රාජකීය නිදන ඇඳකි.

අල්මාරිය ඉතා විශාල ය. කණ්ණාඩි මේසය අලංකාරය. බිත්ති මත අලංකාරවත් ඉටි පන්දම් රඳවන ඇත. බිමට රන්වන් පැහැති පලසක් එලා ඇත.එහි ජනෙල් තිබුණේ දෙකක් පමණි. ඒවා සුදු පැහැති තිර රෙදි වලින් ආවරණය වී ඇත. එමෙන්ම තවත් දොරක් ඇත. එයින් මාලිගයේ බැල්කනියට යා හැක.

“නියමයි” පීටර් කීවේ ය.” හරිම ලස්සනයි”

“මේ අර ගෑනු ළමයාගේ කාමරේ වෙන්ට ඇති”

“ඔව්” ඇන්ජී කීවාය. “කොහොමටත් මට දැනෙනවා එයා දැන් අපි දිහා බලන් ඉන්නවා කියලා”

ඩැනියල් මුව ආයාගෙන ඇන්ජී දෙස බැලුවේ ය. “මාව භය කරන්න එපා ඇන්ජී” ඔහු කීවේ ය.

“ ඉතින් මං ඇත්තනේ කිව්වේ” ඇන්ජී කෝපයෙන් කීවා ය.

“අරක බැල්කනියක් නේද” පීටර් කතාව වෙනතකට යොමුකිරීමට සිතාගෙන කීවේ ය.

“ඔව් මං හිතන්නේ අර ගෑහැනු ළමයා ඔතනින් වැටිලා තමා මැරුනේ” ඇන්ජී ගාණක් නොගෙන කීවා ය.

“ ඇන්ජී” පීටර් කෑ ගැසුවේ ය. “ ඔය ඇති”

ඇන්ජී රවා බැලුවා ය.”ඔය දෙන්නා හරිම බය ගුල්ලොනේ,නේද කේට්”

ඇන්ජී කේට් දෙස බැලුවා ය.එහෙන් කේට් එතන සිටියේ නැත.ඇන්ජී වට පිට බැලුවා ය.කේට් අතුරුදහන් වී ඇත.

# බිත්තියේ තිබූ පණිවිඩය

"කේට් ට මොකද වුනේ" ඇන්ජී බිය වී ඇසුවා ය."කෝ එයා.

පිරිමි ළමයි දෙදෙනාට ද කේට් ව සිහිවුනේ එවිටයි.

"දැන් මෙතන හිටියනේ" ඩැනියල් විස්මය හඟවන කටහඬකින් කීවේ ය." එක පාරටම කොහෙටද එයා...."

"ඉන්න ෂ්...ෂ්..." ඇන්ජී කීවාය."ඔයාලට ඇහෙනවද?"

අනිත් දෙදෙනාත් සාවධානව අසා සිටියෝ ය. එම සද්දය කවුරුන් හෝ පඩිපෙළ නැඟ එන හඬයි. ඔවුහු තිදෙනා බිය වී මුහුනෙන් මුහුණ බැලුවෝය. "කවුද ඒ එන්නේ?"

සද්දය නැවතුණි. කාමරයේ දොර එක්වරම ඇරුණි.පීටර් , ඩැනියල් සහ ඇන්ජී හුස්ම නොගෙන බලා සිටියහ. එහෙත් කවුරුවත් දොරෙන් ඇතුළු වූයේ නැත. සියල්ල ම සන්සුන්ව තිබුණි. ඇන්ජී සුසුමක් හෙලුවා ය.

" ඔයාලා කවුරු එනකන් ද බලන් ඉන්නේ." ඔවුන්ට පිටුපසින් නාඳුනන කටහඬක් ඇසුණි.

ඔවුහු තිදෙනා හැරී බැලූහ.

ඒ සිටීයේ කේට්ය. ඇය රෞද පෙනුමකින් ඔවුන් දෙස බලා සිටියා ය.

"කේට්" ඇන්ජී ඇය ව ඇමතුවා ය.

" කේට්" මම කේට් නෙවෙයි මම එලිසබෙත් මේරි මේ රාජධානියේ කුමරිය" යැයි පවසූ ඇය සිනාසුණා ය.

ඇන්ජී පිරිමි ළමයි දෙස බැලුවා ය."දුවමු" ඇය කීවා ය.,

ඔවුහු දොර ඇරගෙන පඩිපෙලේ දුව ගොස් නැවතත් කොරිඩෝවට පිවිසුණෝ ය.ඉන් පසු හයියෙන් දිවුවෝ ය. එහෙත් එක් තැනකදී ඔවුන්ට නැවතීමට සිදු වූයේ එම කොරිඩෝව අවසන් වී තිබූ බැවිණි. එහි අවසාන බිත්තියේ යමක් ලියා තිබුණි.

ඔයාලා කොහේ ගියත් මගෙන්

බේරෙන්න බෑ

ඔයාලගේ යාළුවාව ඕන නම් මට

ඇන්ජීගේ ආත්මය ඕන

එක දෙයක් මතක තියාගන්න මට

ඇන්ජීව දුන්නොත් අනිත්

තුන්දෙනාට මෙහෙන් යන්න

පුළුවන්.

එය ලේ වලින් බිත්තියේ ලියා තිබු ලිපියකි. ඇන්ජි, පීටර් සහ ඩැනියල් ඒ දෙස ඇසිපිය නොහෙලා බලා සිටියහ.

“අපි ඉවරයි” පීටර් කීවේ ය.

“ඔය දෙන්නා යන්න.” ඇන්ජී කීවා ය.” මම අවතාරේ ළඟට යන්නම්.”

“ ඔයාට පිස්සුද?” ඩැනියල් ඇසුවේ ය.

“බය වෙන්න එපා, ඩැනියල් ඔයාගේ මාලේ තියෙන්නේ කුරුසයක් නේද?” ඒක මට දෙන්නකෝ”

ඩැනියල් ඔහුගේ මාලය ගලවා ඇන්ජීට දුන්නේ ය එහි අග කුරුසයක් තිබුණි.

“ ඔයා දැන් මොකක් ද කරන්න යන්නේ.” පීටර් ඇසුවේ ය.”

“ මම කොහොම හරි කේට් ව බේර ගන්නවා” ඇය කීවා ය. “දෙවියන් වහන්සේ මාත් එක්ක ඉදීවී.” යැයි පැවසු ඇන්ජී කුරුසය සහිත මාලය පැළඳ ගත්තාය. “ඉක්මනට අපි මෙහෙන් යමු.” පීටර් කීවේ ය.

“ පීටර් ඩැනියෙල්” ඇන්ජි එකවරම කතා කළාය. “ බැරි වෙලාවත් මට මොනවහරි වුනොත් ඔයාලා කේට් ව අරගෙන යන්න.”

“හොඳයි” පීටර් කීවේ ය.

“ පරිස්සමින් ඇන්ජි” ඩැනියල් කීවේ ය.

කේට් මගක් ගොසින් නැවත හැරී බලා අත වැනුවා ය. පිරිමි ළමයි දෙදෙනා ද අත වැනුහ.

# අවතාරය

ඇන්ජී වේගයෙන් දිව ගියා ය. ඇය ඉක්මනින් ම බැල්කනියට ළඟා වූවා ය. ඉන්පසු හයියෙන් කෑ ගැසුවා ය. "එළිසබෙත් කුමරිය මගේ ආත්මය මම ඔයාට දෙනවා මගේ යාළුවන් ව අත හරින්න.එය කියූ සැනින් අහසේ විදුලි කෙටීමට පටන් ගත්තේ ය.

සැඩ සුළං විත් ජනෙල් පියන් වේගයෙන් වැසුණි.ඇන්ජී ඉක්මනින්ම කාමරයෙන් පිට වී දිව ගියාය. ඇය මහ දුරක් ගොස් නැවතුණාය.ඈත යමෙකු වැටී සිටින අන්දම ඇය දුටුවා ය,ඒ කේටී විය.

ඇන්ජීට පසු පසින් කට හඬක් ඇසුණි.

" ඔයා මං වෙනුවෙන් මැරෙනවාද"

ඇන්ජී පිටුපස හැරී බැලුවා ය ඇගේ වයසෙම ගැහැනු ළමයෙක් සිටගෙන පිටුපස සිටියා ය.කළුවන් ඇඳුමකින් සැරසී සිටි ඇගේ කළුවන් දිගු කෙස් සලුවක් මෙන් පිළිවලට තිබුණි. ඇගේ කොළ පැහැති ඇස් මලානික බවක් විදහා දැක්වූවා ය.ඇගේ සම අසාමාන්‍ය සුදුමැළි බවක් දැක්වූ අතර නළලේ තිබූ තුවාලයකින් නොනවත්වාම ලේ ගලයි.ඒ අවතාරය යි.ඇන්ජීගේ ඇඟ කිළිපොලා ගියාය. ඇන්ජී නිර්භයව කතා කළාය.

"නෑ,මන් මැරෙන්නේ මගේ යහළුවන් වෙනුවෙන්"

අවතාරය මුහුණේ කුරිරු සිනාවක් මැවුණි."ආ එහෙමද,ඇන්ජී ස්ටාර් ඔයා ඔයාගේ පරම්පරාවේ අයට වඩා යහලුවන්ට ආදරෙයි ද? විශේෂයෙන් ම මේ වැඩකට නැති කෙල්ලට" අවතාරය කේටී ව පෙන්නුවාය. ඒ මොහොතේ ඇන්ජී දුටුවේ අවතාරයගේ අත් ලේ වලින් නැහැවී තිබූ බවයි.

"ඔයා මොකක් ද ඒකෙන් අදහස් කරන්නේ" ඇන්ජී ඇසුවා ය.

"පරම්පරාව ?"

"ඔව්" අවතාරය කීවාය.

"ඇයි ඇන්ජී ඔයා දන්නැද්ද ඔයාගේ පරම්පරාව රජ පරම්පරාවක් කියලා."

"එහෙනම් ඒක නිසා ද?" ඇන්ජී ඇසුවා ය.

"ඔයාට ආපහු බලයට එන්න ඔයාගේ පරම්පරාවේ කෙනෙකුගේ ආත්මය ඕන , ඒක නිසා නේද ඔයාට මාව ඕන වුණේ?"

අවතාරය කිසිවක් නොකියා බලා සිටියේ ය.

" අර හීනේ" ඇන්ජී කීවා ය.

" ඔයාව මැරුවේ කවුද.? නැත්නම් ඔයා මැරුණේ කොහොම ද?"

අවතාරය ඇන්ජී දෙස එක එල්ලේ බැලුවා ය. ඇන්ජී හිරි වැටී ගියාය.''ඔයාට ඒක තේරුණේ නැද්ද?'' අවතාරය ඇසුවා ය. '' මම ඔයාට කියන්නම්''

''ගොඩක් කාලෙකට කලින් මගේ අම්මා මැරුණට පස්සේ මගේ තාත්තා කුඩම්මව ගෙනාවා. එයා මට නපුරු විදියට සැලකුවා.එයා එයාගේ දුවට විතරයි ආදරේ කළේ.මට කළේ වෙනස්කම්. එයාට හිතුණා මම නිසා එයාගේ දුවට ලැබෙන්න තියන දේවල් නැති වෙයි කියලා. කුඩම්මා ගොඩක් බය වුණා. එයාට ඕන වුණා මාව හිර කරලා තියාගන්න.ඒත් එයාට එහෙම කරන්න බැරි නිසා මාව මරන්න තීරණය කළා. එයා මාව බැල්කනියෙන් පල්ලේහාට තල්ලු කරා. මම පලිගන්න හිතාගෙන ආත්මයක් වෙලා ආවා. මම කුඩම්මවයි, නංගිවයි, තාත්තාවයි මරන්න උත්සහා කළා. ඒත් බැරි වුණා. මම බලවත් නෑ. මට අද බලවත් වෙන්න පුලුවන්. අවුරුදු තුන්සීයක් මම මේ දවස එනකම් බලන් හිටියා. දැන් ඉතිං වෙලාව හරි.''

අවතාරය ඇන්ජී දෙසට පියවර තබමින් පැමිණියා ය. ඇන්ජී පියවරෙන් පියවර පසුපසට ගමන් කළාය.

''ඔයා අද දවසම මං දිහා බලාගෙන හිටියාද?'' ඇන්ජී බිය වූ ස්වරයෙන් ඇසුවාය. ''ඔව්'' අවතාරය උත්තර දුන්නාය. '' ඔයාලා මේ මාලිගාවට ආපු වෙලේ ඉඳන් මම ඔය හතරදෙනා එක්කමයි හිටියේ, ඔයාලට වෙලාවකට ඒක දැනුණා නේද?''

ඔව් යැයි පැවසීමට ඇන්ජී මුව විවර කළත් මුවින් වචන පිට නොවුණි.

''මම ඔයා ළගට ඇවිල්ලා රහසින් කතා කරනකොට ඔයාට ඒක ඇහුණා නේද?''

නැවතත් අවතාරය ඉදිරියෙන් ඉදිරියට ආවාය. ඇන්ජී පසුපසින් පසුපසට ගියාය. එකවරම ඇන්ජී බිත්තියේ හැප්පුණි. ඇන්ජී කොටු වී ඇත. ඇයට බේරීමක් නැත.

ඇන්ජීට කර කියාගන්නට දෙයක් නැතිවුණි. ඇන්ජීට කිරීමට තිබුණේ එකදෙයකි. ඒ යාඥා කිරීම පමණි. ඇන්ජී යාඥා කිරීම ඇරඹුවාය. තම මුළු සිතින්ම දෙවියන් වහන්සේ පිළිබඳ සිතුවා ය. එකවරම අවතාරය ඉදිරියට පැමිණීම නැවැත් වූවා ය. " ඔයා" අවතාරය කෑ ගැසුවා ය.

" ඔයා ගාව ලොකු බලයක් තියනවා, මට දරා ගන්න බෑ ඒක."

ඇන්ජී පියවරක් ඉදිරියට ආවා ය. " ඔව්,ඔයාට දරා ගන්න බැරි බලයක් මට තියනවා."

අවතාරය පසු පසින් පසු පසට ගොසින් නැවතී ඇන්ජී දෙස කුරිරු බැල්මක්

හෙලුවා ය. " මොකක් ද ඒ" අවතාරය විමසුවා ය.

ඇන්ජී තම බෙල්ලේ තිබූ මාලය ගලවා එය ඉදිරියට දිගු කළා ය.

එසැණින් අවතාරය මර ලතෝනි දීමට පටන් ගත්තා ය. බිම ඇද වැටී අවතාරය " එපා,එපා ඇන්ජී මම ආයේ කවදා හරි එනවා එදාට ඔයා ඉවරයි."යැයි කෑ ගසමින් අතුරුදහන් වූවා ය. ඇන්ජී ඒ දෙස විස්මයෙන් බලා සිටියා ය.ඉන් පසු ඇය කේට් ළඟට දිව ගියා ය.

"කේට් , කේට් ඇහැරෙන්න අපි යන්න ඕන"

කේට් ඇස් ඇරියා ය. "ඇන්ජී, අර අවතාරය , එයා ආවා. කේට් අමාරුවෙන් කෙඳිරි ගෑවාය."

"හරි කේට් ඔක්කොම හරි" ඇන්ජී කීවාය. " අපි දැන් ඉක්මනට යමු."

ඇන්ජී කේට්ව අමාරුවෙන් ගෙන ගියා ය.කේට්ගේ කරට අත දමා ඇයව වත්තන් කරගෙන හැකි ඉක්මනින් එතනින් පිට වූවා ය.අතරමඟදී ඔවුන් ට පිරිමි ළමයි දෙදෙනා ද මුණ ගැසුණි. සිව් දෙනාම ඉක්මනින් බිම් මහලට ගොස් ප්‍රධාන ඕක් දොරටුවෙන් පිට වී පඩිපෙළ බැස ගියෝ ය. ටික දුරක් ගිය පසු ඔවුහු ආපසු හැරී බැලුවෝ ය. පුදුමයට කරුණක් වූයේ මාලිගය අතුරුදහන් වී තිබීමයි. සිව් දෙනාම ග්‍රේන් කඳු මුදුන දෙස බලා සිටියහ. රෑ බෝ වී තිබූ නිසා ඩැනියල් ඔහුගේ විදුලි පන්දම දැල්වූවේ ය.

ඇන්ජී සුසුමක් හෙළුවා ය. " කවුරුත් අපට වුණ දේ විශ්වාස කරන එකක් නෑ."

"ඔව්" ඩැනියල් කීවාය. " එයාලා හිතයි අපිට පිස්සු කියලා."

ඇන්ජී ඈත අහස දෙස බැලුවා ය. ඈතින් ආලෝක කිහිපයක් ඔවුන් සිටින දෙසට ඇදෙන බව ඇය දුටුවා ය.

"අන්න අම්මලා අපිව හොයාගෙන එනවා." පීටර් කීවේය.

ඩැනියල් තම විදුලි පන්දම අහසට අල්ලා සංඥාවක් කළේ ය. ඔවුන්ගේ දෙමාපියෝ ඔවුන් සොයා ගත්හ.

* * * * * * * *

ග්‍රීෂ්ම නිවාඩුව අවසානයේ දී නැවතත් පාසල් වාරය ඇරඹුණි. පීටර් , ඩැනියල් , කේට් හා ඇන්ජී උද්‍යෙසන කතා බස් කරමින් පන්ති කාමරයේ සිටියහ. කේට් දැන් ඔවුන්ගේ හොඳම මිතුරියක් ය. ඔවුන්ගේ පන්ති භාර ගුරුතුමිය තවත් ගැහැනු ළමයෙකු සමඟ ඔවුන් අසලට පැමිණියා ය.

“ ආ ඇන්ජී මේ අපේ පන්තියට අලුතින් ආපු ළමයෙක් මෙයාව බලා ගන්න ඔයාට පුලුවන්නේ.”

“ආ හා හොඳයි ටීචර්” ඇන්ජී කීවා ය.

රෝස පැහැති ගවුමකින් සැරසී සිටි ගැහැනු ළමයාගේ ඇස් කොළ පාටය.ඇගේ කළුවන් දිගු කොණ්ඩය කරළක් ලෙස ගොතා ඇත. ඇන්ජීට හැඟුණේ ඇයව මීට පෙර දැක ඇති ලෙසයි.

“හලෝ , මම ඇන්ජී ස්ටාර් “ ඇන්ජී ඇයට අතට අත දුන්නා ය.

“ හලෝ , මම එළිසබෙත් මේරී” ගැහැනු ළමයා කීවා ය.”හඳුනා ගැනීමට ලැබීම සතුටක්”

\- නිමි -



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට අලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023 – 11 - 01**